**නාවිතාන්වේලි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපති වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් **2018** දෙසැම්බර් **31** දිනට නාවිතාන්වේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

**ගිණුම්කරණ අඩුපාඩුව**
------------------------

| ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ආධාර වැඩසටහන් යටතේ පානීය ජලය බෙදා හැරීම සඳහා බට ඇලීමේ කර්මාන්තයට රු. 1,993,645 ක යෝජිත ඇස්තමේන්තුව අනුව ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයට අත්තිකාරම් වශයෙන් ගෙවීම් කර, 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය නිමවී නොතිබුණද, මූල්‍ය ප්‍රකාශනවල යෝජිත ඇස්තමේන්තුව වියදමක් වශයෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුම්වල දැක්විය යුතු වේ. | මෙවැනි වැරදීම් ඉදිරියේදී සිදුනොවීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති | | | |
| | වගන්තිය 193 | සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ තොරතුරු අයවැය සමඟ සසඳා වෙනස්කම් සඳහා පැහැදිලි කිරීම ඇතුලත් ප්‍රකාශයක් පිළියෙලකර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | ප්‍රකාශයන් අදාල කාලවල පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු දැනටමත් කර ඇතිබව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ තැන්පත් හයක් සම්බන්ධයෙන් අදාල අයට ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,684,198ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,179,304ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම්හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී | 2,944,500 | 2,819,504 | 3,061,139 | 1,269,148 | 2,856,000 | 1,634,256 | 1,661,755 | 1,510,783 |
| බලපත්‍රගාස්තු | 485,000 | 448,100 | 448,100 | - | 485,000 | 426,300 | 426,300 | - |
| වෙනත් ආදායම් | 6,987,500 | 4,456,400 | 5,092,144 | 1,035,611 | 6,592,000 | 5,939,969 | 4,268,615 | 1,671,354 |

## 2.2.2 බදුකුලි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 සිට 2012 දක්වා කාල පරිච්ඡේදයේ අයකර ගතයුතු රු. 1,234,304 ක හිඟ මස්කඩ බදුකුලි සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු හිඟ මුදලින් දැනටමත් රු. 54,500 ක් ගෙවා ඇති අතර, තවදුරටත් සමථ මණ්ඩලය මගින් මාසිකව හිඟ මුදල ගෙවාගෙන යන බව දන්වා සිටිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතුය. නමුත්, ප්‍රාදේශිය සභාව විසින් 2013 නොවැම්බර් 22 දින කරුණු 05 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවලට අදාල යෝජනා නැගෙනහිර පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය සඳහා යවා තිබුණද, 2018 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වේ. | පළාත් පාලන අමාත්‍යාංශය මගින් 1988.08.23 දිනැති 520/7 අංක දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ IV (ආ) කොටසේ පළාත් පාලන දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්ති 122 සහ 126 අනුව අදාල අතුරු ව්‍යවස්ථා වලින් අතුරු ව්‍යවස්ථා 42 ක් 2018.09.17 දින සිට ක්‍රියාත්මක කරන පරිදි නාවිතාන්වේලි ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම සඳහා 2018.04.19 වන දින මහ සභා රැස්වීමේදී 11 වන තීරණය අනුව අනුමැතිය ලබාගෙන රජයේ ගැසට්පත්‍රයේ පළ කිරීම සඳහා යවා ඇතිබව දන්වා සිටිමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 05 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුර ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | අප ප්‍රාදේශීය සභාවේ අතුරු, ව්‍යවස්ථා අනුව 2017 – 2020 දක්වා කාලපරිච්ඡේදයට අදාල වර්ෂ 4 ක් සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කරන බව දැනුම් දෙමි. |

(ඇ) අත්හැරුනු ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය නොවන සංවිධානයකින් ඉදිකර 2010 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පවරන ලද රු. මිලියන 03 ක් වටිනා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය අදාල සක්‍යතා අධ්‍යයනයකින් තොරව කෝවිලට නුදුරින් ඉදිකර තිබීම නිසා මහජන විරෝධතාවය හේතුවෙන් 2017 ජූලි 12 දින දක්වා නිෂ්ක්‍රීයව පැවතුනි. තවද, මධ්‍යස්ථාන වටා ගසා තිබු වැට සහ අළුතින් ලබා දී තිබු විදුලි සම්බන්ධතාවයට අදාල සවිකිරීම් සොරකම් කර තිබුණි. | අදාල මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කෙරෙමින් පවති. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදි තිරසර සංවර්ධන ඉලක්ක ලබා ගැනීම සඳහා ක්‍රියාකාරකම් 19 ක් සඳහා සැලසුම් සකස්කර තිබුණද, සමාලෝචිත වර්ෂය දක්වා තිරසර සංවර්ධන වැඩ සැලසුම් 05 ක් පමණක් ක්‍රියාත්මකකර තිබුණි. තවද, සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්ක මැනීමට දර්ශක සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක මැනීමට දර්ශකසකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අනාගතයේදී ආදායම් වැඩිකර ගැනීම සඳහා සැලසුම් සභාව විසින් ක්‍රියාත්මක කර වැඩ සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා පොදු දර්ශක සකස්කිරීමට ක්‍රියා කරන බව දන්වමි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන වෙළඳ සැල් 324 ක් සහ නිවාස 6,049 ක් සඳහා වරිපනම් බදු තක්සේරුකර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව දළ වශයෙන් රු. 3,200,000 ක ආදායමක් අහිමි වේ. | වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී වරිපනම් බදු අයකර ගැනීම සඳහා ප්‍රදේශයන් ප්‍රසිද්ධ කර තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

**නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| Mahendra Single Cab වාහන සහ Dual Purpose Cab වාහනය පිළිවෙලින් 2012 දෙසැම්බර් 19 දින සිට 2018 ඔක්තෝබර් 18 දින දක්වා අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර සභාවේ වාහන අංගනයේ ගාල් කර තිබුණි. | අළුත්වැඩියා කර නැවත ධාවනයේ යෙදවීමට කටයුතු කළ යුතුය. | අප විසින් දැනට කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. |